# මේ වනාහි ඔබට වධ දෙන ඔබේම අයහපත් හෘදය සාක්ෂියයි.

**රාවය සංස්කාරකට විවෘත ලිපියක්**

**උවිඳු කුරුකුලසූරිය**

'කිසියම් විවාදාත්මක ප්‍රශ්නයක් මතු වූ විට එම ප්‍රශ්නයේ එක් පාර්ශවයක තර්ක පුළුවන් තරම් හොඳින් කදිම ලෙස හැම විටම ඉදිරිපත් වන්නේ නම්, අනෙක් පාර්ශවයේ තර්ක සොයා ගැනීමට දැඩි විමර්ශනයක් අවශ්‍ය වන්නේ නම්, එවිටද චින්තනය නිදහස් නොවේ යයි ඉතා හොඳින් පැහැදිලිවේ.'

බර්ට්‍රන්ඩ් රසල් ගේ ඉහත කියමන සිහියට ආවේ මීට සති කිහිපයකට ඉහතදී රාවය කියවන විටදීය. මංගල සමරවීරට එරෙහිව දැඩි ප්‍රහාරයක් දියත් කර තිබූ එම කලාපයේ මංගල ජනාධිපති මහින්දගේ චෝදනාවන්ට දුන් පිළිතුර පළ නොවීය. අනෙක් පුවත්පත්ද මහින්දගේ චෝදනා පල කළ ද මංගලගේ පිළිතුරු ලිපිය පළ නො කළේය. මාධ්‍ය මර්ධනයක් ඇතැයි කීමට මීට වඩා සාක්ෂි අවශ්‍ය වන්නේද?

මාධ්‍ය නිදහස තර්ජනයක පවතින මෙවැනි යුගයක මංගලට එරෙහි වීම හා ඔහුගේ අදහස් පළනොකිරීම ස්වකීය සංස්කරණ ප්‍රතිපත්තිය බවට පත්කර ගැනීම රාවය වැනි මාධ්‍ය නිදහසේ පුරෝගාමී පුවත්පතකට වටනේද?

රසල් ගේ ඉහත කියමන මගේ සිතට එකවරම ආවේ රසල් ඔබගේ ප්‍රියතම දාර්ශනිකයා ද වන හෙයිනි. පසුගිය සතියේ ඔබ මව්බිම පිළිබඳව ලියා ඇති ලිපිය කියවූ විට රසල් ගේ 'චින්තන නිදහස' නම් දේශනය නැවතත් මතකයට ආවේය. නිසැකවම රසල් ගිය සියවසේ සිටි විශිෂ්ටතම චින්තකයකි. විවාහයේ පටන් න්‍යෂ්ටික අවි දක්වා ලියවුණු රසල්ගේ ලිපි ලේඛන මගින් පමණක් නොව රසල් ඔහුගේ ක්‍රියාකාරිත්ව හේතුවෙන් ද පරසිඳු විය. පළමුවන ලෝක යුද්ධ සමයේදී ඊට එරෙහිව හෘදය සාක්ෂිමය විරෝධයක් පෑම නිසාම බන්ධනාගාර ගතවූ ඔහු වයස අනූවේදී න්‍යෂ්ටික විරෝධතා පෙලපාලියට සහභාගි වෙමින් ඉදිරියෙන් ගමන් කළේය.

**යම් යම් මත දැරීම හෝ නොදැරීම හෝ නිසා, යම් කාරණා පිළිබඳ විශ්වාසය හෝ අවිශ්වාසය හෝ සම්බන්ධයෙන් අදහස් පළ කිරීම නිසා, නෛතික දණ්ඩනයට යටත් වන අවස්ථාවකදී චින්තනය නිදහස් නැත. නිදහස අවුරාලන මහා බාධක දෙක නම් ආර්ථික දණ්ඩනය සහ සාක්ෂි විකෘති කිරීමය. මේ අදහස් දැරීම නිසාම දිවි පෙවෙත පවත්වා ගෙන යාම කළ නොහැකි විට චින්තනයේ නිදහස් නොවේ යයි හොඳින්ම පැහැදිළිය.**

'යම් යම් මත දූරීම හෝ නොදූරීම හෝ නිසා, යම් කාරණා පිළිබඳ විශ්වාසය හෝ අවිශ්වාසය හෝ සම්බන්ධයෙන් අදහස් පළ කිරීම නිසා, නෛතික දණ්ඩනයට යටත් වන අවස්ථාවකදී චින්තනය නිදහස් නැත. නිදහස අවුරාලන මහා බාධක දෙක නම් ආර්ථික දණ්ඩනය සහ සාක්ෂි විකෘති කිරීමය. මේ අදහස් දූරීම නිසාම දිවි පෙවෙත පවත්වා ගෙන යාම කළ නොහැකි විට චින්තනයේ නිදහස් නොවේ යයි හොඳින්ම පැහැදිළිය. ඒ ටික කීවේද රසල් මය.

ඔබ මව්බිම පුවත්පතේ ආර්ථිකය හා එය වෙළෙඳ පොළ තුළ ලබා දෙන වට්ටම පිළිබඳව සැක මතු කරයි. එහෙත් එහිදී මව්බිමේ ආර්ථිකය වට්ටවන්නට ආණ්ඩුව ගෙන යන ක්‍රියාවලිය ප්‍රශ්න නොකරයි. ඒ සන්දර්භය සැලකිල්ලට නොගනී.

ලේක් හවුස් ආයතනය ආරම්භ කිරීමේදී එහි නිර්මාතෘ ඩී.ආර් විජේවර්ධන වසර ගණනාවක් යනතෙක් එහි අලාභය පියවීම සඳහා අක්කර සියගණනක කුඹුරු යායක් ආයෝජනය කළේය. එකළද නොයෙකුත් අය ලෙක්හවුස් ආයතනයේ ආයෝජනය ගැන ප්‍රශ්න කළහ.

ලේක්හවුස් ආයතනය අරඹා වසර 29 කට පසු විජයවර්ධන මෙසේ කියයි.

'ලංකාවේ ප්‍රවෘත්ති පත්‍ර ඉතිහාසය පමණක් නොව, අනික් හැම රටවලම ප්‍රවෘත්ති පත්‍ර ඉතිහාසයද, මුදල් පක්ෂයෙන් ස්ථිරත්වයෙහි නොපිහිටුවූ ප්‍රවෘත්ති පත්‍රයකට මහජනයා තුළ විශ්වාසය ඇතිකොට ඔවුන්ගේ ගෞරවය දිනාගත නොහැකි බව ප්‍රත්‍යක්ෂ කරයි.

ලේක්හවුස් මන්දිරයෙහි පිහිටි සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර ව්‍යාපාරය මුදල් පක්ෂයෙන් ස්ථිරසාර තත්ත්වයක් පිහිටි බැව් හෙළි කිරීමට මේ ප්‍රස්තාවයෙහි සිතුවේ ආත්ම වර්ණනාවක් කරන ආශාවකින් නොවන බව සැලකිය යුතුය. ප්‍රවෘත්ති පත්‍ර පළ කරන සමාගමක් විසින් ආශා කරන මුදල් පක්ෂයෙන් සියලු

පහසුකම් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට ඇත්තේය.

ආරම්භයේ පටන්ම සමාගම ස්ථිර අත්තිවාරමක් උඩ පැවැත්තේය. එහෙත් එහි කොටස්කාරයෝ තමන් විසින් යෙදූ මුදලට පොලී වශයෙන් සුළු මුදලක් පමණක් ලාභ වලින් ගත්හ. මේ සාවධාන ප්‍රතිපත්තිය වෙළඳ සමාගමට මහෝපකාරයක් විය. සමාගම වැඩි දියුණු කරලීමේ කාර්යාල සියල්ල සමාගම සතු ආදායම් මාර්ග වලින්ම ලැබෙන මුදලින් කරලීමට පුළුවන්ව තිබේ.

මේ සමාගම සතු ණය ඔප්පු, උකස් ඔප්පු, බැංකු ණය හෝ නොමැත්තාහ. එහි ආරක්ෂක අරමුදලද, අරමුදලට ආසන්න වන පිරිදි විශාලය. එය සතු ආදායම් මාර්ග මුලු අරමුදලට එතරම් අඩු නොවේ. දේපළ හා වෙනත් සුරක්ෂිත ව්‍යාපාර වෙනුවෙන් තැන්පත් කළ මුදල් සමාගමට ඇත්තේය. මේ හේතුකොටගෙන මහජනයා කෙරෙහි සම්පූර්ණ පක්ෂපාත භාවයෙන් නිර්භීතව සේවය කිරීමට ලේක්හවුස් මන්දිරයේ පුවත්පත් වලට පුළුවන්කම ලැබී තිබේ. කවර හෙයින්ද? ධනවතුන්ට හෝ දේශපාලනඥයන්ට හෝ කිසිකලෙක එය කෙරෙහි බලපෑමට නුපුළුවන් බැවිනි.' (විජේවර්ධන 1938 දෙසැම්බර් 4)

රාවය අරඹා වසර 29 කට පසුවත් පාඩු ලබන බැවින් අනෙක් අයගේ පාඩු පෙන්නමින් 'කුමන්ත්‍රණ න්‍යාය' ඉදිරිපත් කිරීම යුක්ති සහගතයයි ඔබ සිතන්නේද?

ඔබ මව්බිම මංගලගේ දේශපාලන ව්‍යාපෘතියක් බව කියයි.

ලේක්හවුස් ආයතනය කළයේද අංකල් නෙවිල් පාටිය රජ කරවීමටය. 'දිවයින ඇරඹුවේද දේශපාලන ව්‍යාපෘතියක් ලෙසය. එනම් උපාලි විජේවර්ධන රජ කරවීමටය. එකල ප්‍රේමදාසගේ දැඩි උදහසට දිවයින පුවත්පත ලක්වූ බව නොරහසකි. එහෙත් එකල පැවැති මාධ්‍ය නිදහසේ සන්දර්භය තුළ දිවයින රඟපෑ සාධනීය භූමිකාව අපට අමතක කළ හැකිද? ඔබ පවා එකළ දිවයිනට ලීවේය.

ලේක්හවුස් ජනසතු කිරීමෙන් පසු ඇරඹී විජය පුවත්පත් දේශපාලන ව්‍යාපෘති නොවන්නේද? එහෙත් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට බරපතලම විවේචන ගෙන ආවේ සන්ඩේ ටයිම්ස් පුවත්පත් බව අපට අමතක කළ හැකිද? මෙයින් පෙනෙන්නේ ආයෝජනය සාධකය තිබුණද පුවත්පතක හැඩ ගැසීමට වෙනත් සාධකද බලපාන බව නොවේද?

**මව්බිම පුවත්පත සම්බන්ධයෙන් ඔබගේ තර්කනයේ මූලධර්මය සම කළ හැක්කේ පතරොම් දමා සූදානම් කොට ඇති ඕනෑම අවස්ථාවක ඕනෑම කෙනෙකුට පාවිච්චියට ගත හැකි තුවක්කුවකටය. කිසියම් බලධාරියකුට එය පාවිච්චි කිරීමට උවමනානම්, ඔහු කළ යුතු වන්නේ අදිසි අවශ්‍යතාවයක් පිළිබඳ (ව්‍යාජ වුවත්) සැබෑ සේ පෙනෙන හේතුවක් ඉදිරිපත් කිරීම පමණකි.**

කොටින්ම කිවහොත් කලින් කලට රාවයට දේශපාලන ව්‍යාපෘති නොතිබුණේද? විජය කුමාරතුංග ඝාතනය කිරීමට පෙර කලාපයේ ලිවූ 'වම දේශපාලන කුමන්ත්‍රණයක' නම් ලිපියේ සිට ඇතුලත්මුදලි රජ කරවීම, චන්ද්‍රිකා රජ කරවීම, රනිල් රජ කරවීම, කරු රජ කරවීම ආදී පොඩි පොඩි ව්‍යාපෘති තුළ තබා මෙන්ම එක එක කාලය තුළ මූල්‍යමය තත්ත්වය තුළ තබා රාවය පිළිබඳව ද ඔබ මව්බිම සම්බන්ධයෙන් කරන විග්‍රහය කළ හැකි නොවේද? එහෙත් එමගින් මාධ්‍ය නිදහසත් මහජනතාවට වෙනත් අදහස් දැන ගැනීමටත් රාවය කළ ඓතිහාසික මෙහෙවර අවතක්සේරු කළ හැකිද? ඒ අර්ථයෙන් බැලූ විට 'මව්බිම මංගලගේ' නම් උප කල්පනය නිවැරදි යැයි සිතුවද මව්බිම මහජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතියට තවත් මානයක් එකතු නොකළේද? තරඟකාරී වෙළෙඳ පොල යාන්ත්‍රණය පිළිගන්නේ නම් ස්වකීය පුවත්පත විකිණීම හා ස්ථාවරත්වයක් ගොඩනගා ගැනීම සඳහා තමන් කැමති වට්ටමක් දීමට ඇති අයිතියද පිළිගත යුතුය. පුවත්පත්වල අයථා හැසිරීම් සම්බන්ධයෙන් වන වඩාත්ම ප්‍රබල ආරක්ෂණය වන්නේ විවිධත්වය සමගින් වන මාධ්‍ය තරඟකාරිත්වයයි. වෙළෙඳ උපක්‍රම මගින් පමණක් වෙළඳ පොළෙහි පැවැතීමට අවශ්‍ය අන්තර්ගතය සැපයෙන්නේ නැත. එනම් මාධ්‍ය හිමියන්ගේ ඇති විය හැකි අයථා බලපෑම අවම කරගැනීමට හොඳ තරඟකාරී වෙළඳ පොලක් හේතුවන බවය.

ඔබගේ මව්බිමට එරෙහිව තර්කය තව දුරටත් ඉදිරියට ගෙන ගිය හොත් අපට ඉතියෝපියාවේ ආදර්ශය අනුගමන කල හැකි වනු ඇත. ඉතියෝපියාවේ පුවත්පත් වාර්ෂිකව මුදල් ගෙවා තම ලියාපදිංචිය අලුත් කර ගත යුතුය. ලියාපදිංචිය සඳහා බැංකු ඇපකරයක් ද මාධ්‍යවේදීන්ගේ විය හැකි අතපසු වීම් සඳහා සහතිකයක්ද සැපයිය යුතුවේ. ඊට අමතරව සෑම වසරක් ආරම්භයේදීම හා ප්‍රවෘත්ති හා සංස්කෘතික අමාත්‍යාංශය ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක ආර්ථික ශක්‍යතාවය පෙන්විය නොහැකි මාධ්‍ය ආයතනවල ලියාපදිංචි අහෝසි වේ.

චින්තනය නිදහස් කිරීම සඳහා වෙනත් සාධක ඇති බව අපි දනිමු. 'චින්තනය නිදහස් වන්නේ අනෙකුත් විශ්වාසයන් සමග නිර්බාධ තරඟයකටද භාජනය වූ විට පමණක් යයි අපට කිව හැකිය. ඒ කියන්නේ හැම

විශ්වාසයකටම තමන්ට පදනම් වූ තර්ක ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන විට සහ විශ්වාසය නිසා නීතිමය හා මුදල්මය වාසි හෝ අවාසි නූපදින විට එසේ වනවානම් ඒ වනාහි පරමාදර්ශී තත්ත්වයකි. එම පරාමාදර්ශී තත්ත්වය විවිධ හේතුන් නිසා මුලුමනින්ම අත්පත් කරගැනීමට නුපුලුවන් වනු ඇත. එනමුත් අද තිබෙන තත්ත්වයට වඩා එවෙත වඩාත් ලංවෙන ආකාරයට කටයුතු කරන්නට නම් හොඳින්ම පුලුවන්කම තිබේ.' යැයි රසල් කීවේ එහෙයිනි.

මව්බිම පුවත්පත සම්බන්ධයෙන් ඔබගේ තර්කනයේ මූලධර්මය සම කළ හැක්කේ පතරොම් දමා සූදානම් කොට ඇති ඕනෑම අවස්ථාවක ඕනෑම කෙනෙකුට පාවිච්චියට ගත හැකි තුවක්කුවකටය. කිසියම් බලධාරියකුට එය පාවිච්චි කිරීමට උවමනානම්, ඔහු කළ යුතු වන්නේ අදිසි අවශ්‍යතාවයක් පිළිබඳ (ව්‍යාජ වුවත්) සැබෑ සේ පෙනෙන හේතුවක් ඉදිරිපත් කිරීම පමණකි. පාවිච්චියට ගන්නා හැම වාරයෙකදීම මේ මූලධර්මය අපේ නීතියෙහි හා චින්තනයෙහි තව තවත් ගැඹුරට මුල්බැස ගනී. අලුත් අරමුණු ඉටු වන සේ ව්‍යාප්ත වේ.

මේ වනාහි ඔබට වධ දෙන ඔබේම අයහපත් හෘදය සාක්ෂියයි. ඔබ අවට සිදුවන දේ ගැන ඔහේ තුෂ්නිම්භූත වී බලා ඉන්නට ඉඩ හැරීමට ඔබගේ මිතුරන්ගේ හෘදය සාක්ෂීන් ඉඩ නොදේ.